සුබස් සිතිවිලි

වි ක ධර්මබන්ධු

ජී බී ගේ "නිශ්ශබ්දතාව" ගැන

"සුරගුරුවත් උතුරු දෙම්හ යි වනපොතින සමහරු අත් සතර පිරුවති නොයෙක තැන" ගිරා සන්දේශයේ ඇති කවි දෙපදය මා ගත්තේ එහි ඇති "උතුරු" යන වචනය නිසාය. අපි උත්තරයත් ප්‍රතිඋත්තරයත් යන වචන දෙක එක්ම තේරුම දීම සඳහා බාවිතා කරමු. උත්තර යන්න උතුරු කියාත් ප්‍රතියුත්තර (ප්‍රති උත්තර) යන්න පිලිඋතුරු - පිලිතුරු කියාත් සිංහලට බිඳී ඇත. ප්‍රශ්නයට උත්තර දෙනහි - පිලිතුරු දෙනවා යන්න මිස ප්‍රශ්නයට / පැනයට උතුරු දෙනවා යන්න අපට හුරු නැත. එහෙත් එය නිවැරදිය.

මගේ -පී බී ගේ නිශ්ශබ්දතාව (ය) වන නිසඳස් පද්‍ය" නම් ලිපිය කියවා ඒ පිළිබඳ තම අදහස් දැක්වූ ඩබ්ලිව් ජයවර්දන මහතාට කෘතඥතා පූර්වකව ස්තූති කරමි. එතුමා මට පිලිතුරුක් දෙන බව කියා ඇතත්, ඇත්තේ හැටියටම එතුමා කර ඇත්තේ තම අදහස් දැක්වීමය. මා ප්‍රශ්නයක් අසා නැති හෙයින්, උත්තරය හෝ පිලිතුරු යන වචනය එතනට අදාල නැත.

'කාව්‍ය' යන වචනය සිංහලට බිඳී ඇත්තේ 'කවි' යනුවෙනි. 'කවි' ම 'කවි' වී ඇතැයි සිතමි. දේව - දේවි වී ඇත්තේත් ඒ නියරට අනුව යැයි සිතමි. 'පද්‍ය' යන්න සුමංගල දිස්නරියේ දැක්වෙන්නේ -පාදයන්ගෙන් බඳනා ලද සිව්පද ගාතා ශ්ලෝක ආදිය" යනුවෙනි. - පද්‍ය කාව්‍ය" පැදිකවි යනුවෙනුත් "ගද්‍ය කාව්‍ය" ගැදි කවි යනුවෙනුත් හැඳින්වේ. ඒ අනුව කවි සිලුමිනත් සසදාවත් පද්‍ය කාව්‍ය වන අතර අමාවතුරුත් බුත් සරනත් ගද්‍ය කාව්‍ය වේ.

පද්‍ය - කාව්‍ය පැටලිල්ල නිසා එතුමාගේ ලිපිය අනවශ්‍ය ලෙස දික් වී ඇති බව පෙනේ. කවි/ කවි යන්න අද බෙහෙවින් යෙදෙන්නේ 'සිපද' අරුතිනි. ස - පද, දස - පද, දොලොස් - පද, සොලොස් - පද (සැහැලි) යනුවෙන් ද පැදි වර්ග ඇත. පද යන්න ද තේරුම් දෙකක යෙදේ. - වචනය" යන්න එක තේරුමකි. - පාදය" යන්න අනෙක් තේරුමයි. සිව්පද සහ සිව්පා යනු එක් ම තේරුමක් ඇති පද දෙකකි. ඒ අනුව සිව්පදය/ සිව්පාවුත්, සිව්පැදියා/ සිව්පාවාත් එක්ම තේරුම දෙන බව පෙනේ.



නව අරහාදි බුදු ගුන කියවෙන ඉතිපිසෝ පාටය (එය ගාතාවක් නොවේ) බන දහම් පොත්වල දැක්වෙන්නේ,

"ඉතිපි සෝ භගවා 1 අරහං 2 සම්මා සම්බුද්ධො 3 විජ්ජාචරන සම්පන්නෝ 4 සුගතෝ 5 ලෝකවිදූ 6 අනුත්තරෝ පුරිස ධම්ම සාරතී 7 සත්ථා දේව මනුස්සානං 8 බුද්ධෝ 9 භගවාති" යනුවෙනි. මේ (ගද්‍ය) පාටය අප කියවන්නේ තාලයකට විරිතකට අනුවය.

එයම කෙනෙකුට
"ඉතිපි සෝ භගවා
අරහං
සම්මා සම්බුද්ධො
විජ්ජාචරන සම්පන්නෝ
සුගතෝ
ලෝකවිදූ
අනුත්තරෝ පුරිස ධම්ම සාරතී
සත්ථා දේව මනුස්සානං
බුද්ධෝ
භගවාති"

යනුවෙන් ගැදිපැදියක් විදියට ලියා ගෙන තාලයකට ගැයිය හැකිය. මම එය පද්‍යයක් යැයි නො කියමි. "වාක්‍යං රසාත්මකං කාව්‍යම්" අනුව එය කවක් විය හැකි දැයි නොදනිමි. මෙම දෙසැම්බර් සන්නසේ "සුභාෂිතයෙන්" ලිපියේත්, "සුබස් සිතිවිලි" ලිපියේත් මීට අදාල අදහස් දැක්වා ඇත.

"සඳසස් (ඡන්දස්) යන්න සුමංගල දිස්නරියේ දැක්වෙන්නේ "ඒ ඒ වෘත්තයෙහි (දිග) මෙපමන මෙපමන විය යුතුය යනාදිය උගන්වන ශාස්ත්‍රය" යනුවෙනි.

"දැතවිලම්බිතමාහ නභෝ භරෞ" යන්නේ තේරුම -න - භ" දෙකින් සහ -භ - ර" දෙකින් යුක්ත වූයේ -දැතවිලම්බිත" වේ යනුයි.

-න - - - - - - - දැ ත වි /භ - - - ලම් බි ත/ භ - u - - මා භ න / ර - u - u භෞ භ රෞ" යන පදය ලියා ඇත්තේද එම විරිතිනි.

"ගු - න - බ - / u - බ - / ගේ u ලො - ෂ -/බා u ද, හම් u, ඔ - බැ - ර -/අන් u කි - සි -/වෙක් u නි - සි -/නෑ u කි - යා u, වි - දු - ලි -/ යන් u පැ - හැ - /පත් u ර - න - /දම් u සෙ - සින් u, ප - ල - ඳ/වන් u නෙ - ඔ/බේ u ගෙ - ලෙ - / මැයි ම බ - ලන් u" යන සොලොව ලියා ඇත්තේ ඒ විරිතිනි.

යම්කිසි ලියවිල්ලක ඡන්දසක් ඇත් නම් එය පද්‍යයකි. එහි ඡන්දසක් නැත් නම් එය ගද්‍යයකි. සිත්දුවක ඇත්තේ ඡන්දසක් නොවේ යනු මගේ හැඟීමයි. "අප ස්ථ - ථ - ලංකා - නමෝ - ඕ -" මෙහි ඡන්දසක් ඇද්දැයි මම නොදනිමි. මොහිදීන් බෙග් ගයන සිත්දුවක ඇති "කුමට ද කා බ නිතිසැර සෙන්නේ - කොතැනද මේ කය අර ගෙන යන්නේ" යනු කවි දෙපදයකි. ඔක්තෝබර් සන්නසට මා ලියූ ගැදිපැදි

MIGRATE TO AUSTRALIA

MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES

The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

OFFSHORE
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students

"EXPERIENCE THE DIFFERENCE"

Affordable fees & easy payment terms

Meet our qualified consultants with **years of experience** who can deliver the **results**

Senior Migration Consultants:

Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986

Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.

Consultation by Appointment only

Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website

www.multinational.com.au

E-mail : info@multinational.com.au

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696